# 12. ආනන්ද කුමාරස්වාමි

**ශ්‍රේණිය : 9**

**වාරය : 11**

**නිපුණතා මට්ටම :**

**9.5 විවිධ නායකයින්ගේ චරිත කතා පරිශීලනය කරයි.**

**1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතුව කතා කරයි.**

**6.4 සම්මත රීතිවලට අනුගතව වාක්‍ය ලියයි.**

## ක්‍රියාකාරකම්

**පාඩම හොඳින් කියවන්න.**

**01. පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. 'ආනන්ද කුමාරස්වාමි' යනු කවරෙක් දැයි හඳුන්වන්න.

   ..........................................................................................................................................

   ..........................................................................................................................................

2. එතුමා ලක්මවගේ අභිමානවත් පුත්‍රයෙකු ලෙස පිළිගැනීමට හේතු වූ ප්‍රධාන ම කරුණ කුමක් ද?

   ..........................................................................................................................................

3. යටත්විජිත සමයේ බටහිර අධ්‍යාපනය ලත් බොහෝ ආසියාතිකයන් අතරින් කුමාරස්වාමි වෙනස් වූයේ කුමන කරුණක් නිසා ද?

   ..........................................................................................................................................

4. එතුමා තම ප්‍රමුඛ කාර්යය ලෙස සැලකුවේ කුමක් ද?

   ..........................................................................................................................................

5. කුමාරස්වාමි මහතාගේ ජීවන තොරතුරු දක්වන්න.

   i. උපන් දිනය - ..............................................................................................

   ii. පියා - ..............................................................................................

   iii. ළමා කාලය - ..............................................................................................

   iv. අධ්‍යාපනය ලැබූ පාසල - ..............................................................................................

   v. පාසල් කාලයේ දී දක්ෂතා දැක්වූ ක්ෂේත්‍ර - ..............................................................................

   vi. විපත සිදු වූ දිනය - ..............................................................................................

6. මෙතුමා වඩාත් සිත් ගත් විෂයය ලෙස දැක්වෙන්නේ කුමක් ද?

..........................................................................................................................................

7. ලංකාවට පැමිණියේ කිනම් වර්ෂයේ දී ද?

..........................................................................................................................................

8. ලංකාවට පැමිණි කුමාරස්වාමි මහතා මුලින්ම වැඩ භාර ගත් දෙපාර්තමේන්තුව කුමක් ද?

..........................................................................................................................................

9. ප්‍රවාහන පහසුකම් නොමැති යුගයේ දී පයින් හා කරත්තයෙන් ගොස් පර්යේෂණවල නිරත වූ ක්ෂේත්‍ර මොනවා ද?

.......................................................................................................................

10. එතුමාගේ මධ්‍යකාලීන සිංහල කලා කෘතියේ ඇති විශේෂ වැදගත්කම කුමක් ද?

..........................................................................................................................................

11. එම ග්‍රන්ථයෙහි කරුණු දැක්වෙන විෂයයන් හා කර්මාන්ත දහයක් ලියන්න.

..............................................  ..............................................

..............................................  ..............................................

..............................................  ..............................................

..............................................  ..............................................

..............................................  ..............................................

12. සීගිරි චිත්‍ර සම්බන්ධයෙන් බෙල් මහතා දරන මතය කුමක් ද?

..........................................................................................................................................

13. කුමාරස්වාමි මහතා දරන මතය ලියන්න.

..........................................................................................................................................

14. ඔහුගේ ඉන්දීය හා ඉන්දුනීසියානු කලා ඉතිහාසය නම් මාහැඟි කෘතියෙහි අධ්‍යයනයට බඳුන් වූ ක්ෂේත්‍රය කුමක් ද?

..........................................................................................................................................

..........................................................................................................................................

15. ඔහුගේ ශාස්ත්‍රීය අධ්‍යයනයන්ට හසු වූ විෂය ක්ෂේත්‍ර මොනවා ද?

..........................................................................................................................................

16. ඔහු විසින් රචිත කෘති 6ක් දක්වන්න.

i. ................................................ ii. ................................................
iii. ................................................ iv. ................................................
v. ................................................ vi. ................................................

17. කුමාරස්වාමිගේ සුවිසල් මෙහෙවර අගයනු වස් ඉන්දියානුවන් හා ලාංකිකයන් කටයුතු කළේ කෙසේ ද?

.........................................................................................................................................

## 02. පාඩමේ දැක්වෙන මෙම පදවල අර්ථය ලියන්න.

i. අදීන - ....................................................
ii. ශික්ෂණය - ....................................................
iii. උද්භිද - ....................................................
iv. විචාරක්ෂිය - ....................................................
v. මෙහෙවර - ....................................................
vi. ආවේණික - ....................................................
vii. ප්‍රයත්න - ....................................................
viii. විශ්‍රැත - ....................................................
ix. කුම්භකාර - ....................................................
x. නිත්‍ය - ....................................................

## 03. පහත දී ඇති වාක්‍යාංශ සඳහා තනිපද පාඩමෙන් සොයා ලියන්න.

i. ගලින් ම කරන ලද - ....................................................
ii. ලීයෙන් කරන ලද - ....................................................
iii. ආසියාවේ වාසය කරන්නෝ- ....................................................
iv. පුරාණ කාලයට අයත් - ....................................................
v. සම්ප්‍රදායට අයත් වූ - ....................................................
vi. වෙළඳාමක් බවට පත්වීම - ....................................................
vii. නැවත නැගී සිටීම - ....................................................
viii. යම් රූපයකට සමාන සේ නිමවන ලද රූපය - ....................................................
ix. පරම්පරාවෙන් උරුම වූ - ....................................................
x. ළඟා වීමට අමාරු දුෂ්කර මග - ....................................................

<u>කර්තෘ කාරක හා කර්ම කාරක වාක්‍ය</u>

- **කර්තෘ කාරක වාක්‍ය**

  යම් වාක්‍යයක කර්තෘ හෙවත් ක්‍රියාව කරන්නාට අනුව අවසාන ක්‍රියාව තැබෙන වාක්‍ය වේ.

- **කර්ම කාරක වාක්‍ය**

  යම් වාක්‍යයක ක්‍රියාවට යටත් වන අනුක්ත පදය උක්ත පදය ලෙස සකස් කර ඒ අනුව ආඛ්‍යාතය හෙවත් අවසාන ක්‍රියාව උක්ත වූ කර්මයට අනුව තැබෙන වාක්‍ය වේ.

## 1. පහත දී ඇති වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. ළමයා පාඩම් කරයි. - ..........................................................................

ii. අම්මා දරුවන් රකියි. - ..........................................................................

iii. හෙදිය රෝගීන් රැක බලා ගනියි. - ..........................................................................

iv. ගුරුවරු දරුවන් යහමග යවති. - ..........................................................................

v. ගුරුළු ගෝමී අමාවතුර ලිව්වේ ය. - ..........................................................................

vi. ගොවියෝ ගවයින් රකිති. - ..........................................................................

vii. රණවිරුවෝ රට රකිති. - ..........................................................................

viii. වෙළෙන්ඳා බඩු විකුණයි. - ..........................................................................

## 2. පහත දැක්වෙන වාක්‍ය කර්තෘ කාරකයට හරවා ලියන්න.

i. වන අලින් විසින් වගා බිම් වැනසෙයි. - ..........................................................

ii. කම්කරුවා විසින් මාර්ගය පිරිසිදු කෙරේ. - ..........................................................

iii. පොලිසිය විසින් සොරු අල්ලා ගනු ලැබුවෝ ය. - ..........................................................

iv. මව විසින් දැරිය පෝෂණය කෙරෙයි. - ..........................................................

v. දෙමව්පියන් විසින් දරුවෝ ආරක්ෂා කෙරෙති. - ..........................................................

<u>මාතෘකානුකූල කථා</u>

මාතෘකාවක් ඔස්සේ කල් ඇතිව සූදානම් වී හෝ ක්ෂණික ව හෝ කතාවක් පැවැත්වීමේ දී ඔබේ අවධානයට යොමු විය යුතු කරුණුවලට (√) ලකුණත් එසේ නොවන කරුණු ඉදිරියේ (x) ලකුණත් යොදන්න.

i. තමන් තෝරා ගත් මාතෘකාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම ( )

ii. වචන පැහැදිලි හා නිවැරදි ව උච්චාරණය කිරීම ( )

iii. හැකි තරම් උස් හඬින් කතා කිරීම ( )

iv. ඉදිරිපත් කරන කරුණු තහවුරු කිරීමට අවශ්‍ය අංගචලන යොදා ගැනීම ( )

v. එක ම කරුණ නැවත නැවත ඉදිරිපත් කිරීම ( )

vi. ආවේගයෙන් යුතුව කතා කිරීම ( )

vii. අනවශ්‍ය වේගයෙන් තොරව සංයමයෙන් කතාව ඉදිරිපත් කිරීම ( )

viii. කාලය පිළිබඳ ව අවබෝධයෙන් යුතුව කතා කිරීම ( )

ix. ආකර්ෂණීය ආරම්භයක් යොදා ගැනීම ( )

x. අවශ්‍ය ස්ථානවල හඬ උස් පහත් කර ශ්‍රාවක අවධානය දිනා ගැනීම ( )

# පිළිතුරු

## ආනන්ද කුමාරස්වාමි

01.

1. දහනව වන සියවසේ පහළ වූ ශ්‍රේෂ්ඨතම ආසියාතිකයා, පෙරදිග සංස්කෘතිය හා කලාව පිළිබඳ විශ්‍රුත දැනුමැති පඬිවරයෙකි. කලා විශාරදයෙකි. දාර්ශනිකයෙකි.
2. පෙරදිග රටවල විශිෂ්ටත්වය බටහිර ලෝකයා හමුවේ පෙන්වා දීම
3. බටහිර චින්තනය උසස් ලෙස සැලකූ යුගයක, පෙරදිග සංස්කෘතිය ලෝ වැසියන්ට හඳුන්වා දීම
4. පෙරදිග සංස්කෘතිය ලෝ වැස්සන් අතර පතුරුවාලීම
5. i. 1877 අගෝස්තු මස 22    ii. ශ්‍රීමත් මුතු කුමාරස්වාමි

   iii. එංගලන්තයේ ගත විය    iv. වයික්ලිෆ් විදුහල

   v. දක්ෂ ක්‍රීඩකයෙක්, දේශකයෙක්    vi. 1947 සැප්තැම්බර් 19

6. භූ ගර්භ විද්‍යාව
7. 1903 දී.
8. ඛනිජ විද්‍යා දෙපාර්තමේන්තුවේ
9. පුරාවිද්‍යාත්මක තොරතුරු, සමාජ විස්තර, කලා ශිල්ප
10. ලාංකේය කලාවේ ගම්භීරත්වය හා අදීනත්වය. බටහිරට හඳුන්වා දෙමින් ලාංකික කලාව ලෝකයාට හඳුන්වා දෙමින් ලාංකික කලාව ලෝක කලා සිතියම තුළ ප්‍රථම වරට රැඳ වූ කෘතිය
11. සිංහල මෝස්තර, ගෘහ නිර්මාණ ශිල්පය, ආරාමය කර්මාන්ත, ලෝහ කර්මාන්තය, ලාක්ෂා කර්මාන්තය, මැටි කර්මාන්තය, රෙදි විවීම, පැදුරු විවීම ග්‍රන්ථාවසානයේ එන තොරතුරු ද අධ්‍යයනය කරන්න.
12. මල් අතැතිව විහාරය කරා යන රජ වාසල ස්ත්‍රීන් බව
13. දිව්‍ය අප්සරාවන් බව
14. ලංකාව, ඉන්දියාව ඇතුළු පෙරදිග රටවල කලා ශිල්ප අධ්‍යයනය
15. පෙරදිග දර්ශනය, ආධ්‍යාත්මික විද්‍යාව, ආගම, ප්‍රතිමා කලාව, සාහිත්‍යය, භූගර්භ විද්‍යාව,

    සාම්ප්‍රදායික දැනුම
16. i. පෙරදිග පණිවිඩය    ii. කලාව හා ස්වදේශකත්වය    iii. විශ්වකර්ම

    iv. ඉන්දීය චිත්‍ර    v. ඉන්දීය සංගීතය    vi. ආසියාතික කලාව

    vii. වේදය හැදෑරීමට නව මගක්

17. සමරු මුද්දර නිකුත් කිරීම හා ශ්‍රී ලංකාවේ කොළඹ ප්‍රධාන මාවත එතුමා නමින් නම් කිරීම

02. i. නිදහස්, නිවහල් ii. හික්මීම සංවරය

iii. ගස්වැල්, ශාක iv. විමසිලිමත් බැල්ම

v. ක්‍රියාදාමය vi. පරම්පරාවෙන් උරුම

vii. උත්සාහය viii. පැතුරුණු

ix. කුඹල්කරුවා x. ස්ථිර

03. i. ශෛලමය ii. ආරාමය iii. ආසියාතිකයෝ

iv. පෞරාණික v. සාම්ප්‍රදායික vi. වාණිජකරණය

vii. පුනරුත්ථාපනය viii. ප්‍රතිමා ix. පාරම්පරික x. දුර්ග

## කර්තෘ කාරක කර්ම කාරක වාක්‍ය

1. i. ළමයා විසින් පාඩම් කෙරේ / කරනු ලබයි.

ii. අම්මා විසින් දරුවෝ රැකෙති / රකිනු ලබති.

iii. හෙදිය විසින් රෝගීහු රැකබලා ගැනෙති / ගනු ලබති.

iv. ගුරුවරුන් විසින් දරුවෝ යහමග යැවෙති / යවනු ලබති.

v. ගුරුළුගෝමී විසින් අමාවතුර ලියන ලදී / ලියැවිණි.

vi. ගොවියන් විසින් ගවයෝ රැකෙති / රකිනු ලබති.

vii. රණවිරුවන් විසින් රට රැකේ / රකිනු ලැබේ.

viii. වෙළෙන්දා විසින් බඩු විකිණේ / විකිණනු ලබයි.

2. i. වල් අලි වගා බිම් වනසති.

ii. කම්කරුවා මාර්ගය පිරිසිදු කරයි.

iii. පොලිසිය සොරුන් ඇල්ලූහ.

iv. මව දැරිය පෝෂණය කරයි.

v. දෙමව්පියෝ දරුවන් ආරක්ෂා කරති.

## මාතෘකානුකූල කථා

(i) √ (ii) √ (iii) x (iv) √ (v) x (vi) x (vii) √ (viii) √ (ix) √ (x)√